**<u>රැඳවුම් නියෝග මත, CIDh බාරයේ සිටින  හපුආරච්චිගේ දොන් පියුම් හස්තික (පියුමා)ට ආරක්ෂාව සලසන ලෙසට, ඔහු ගේ එකම භාරකාරිය වන ආච්චි,</u>** 2024.02.27 දින, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අමතන ලද ලිපිය.

'' ඔබ දන්නා පරිදි හපුආරච්චිගේ දොන් පියුම් හස්තික (පියුමා) අවුː 26 යි, මාගේ මුණුපුරා වේ. ඔහුට සහෝදර සහෝදරියන් නැත. විවාහ වීමට සිටි ''සුදු'' නැමැත්තිය සිටින්නේ ඩුබායි හි බව කියනු ලැබේ.

මා එකම භාරකරු වේ.

2024.02. 24 දින මාහට ඔහුව දැක කතා කිරීමට අස්ථාව ලබා දෙන ලදි.

ඒ අවස්ථාවේ ඔබ නිලධාරීන් ඉදිරියේ තමා දන්නා දේ හෙළිකර ඇති බව ඔහු කියා සිටන ලදි.

ගතවු දින කිහිපය තුල විවිධ තරාතිරම් වල පුද්ගලයින් ප්‍රකාශ කරන දේ අසා මා දැඩි මානසික පිඩනයකට ලක්ව සිටිමි.

**සමහරු ප්‍රකාශ කරන්නේ;**
ඔබ බාරයේ සිටින මාගේ මුණුබුරාව, පිටතට ගෙනගොස් ජීවිතයට හානි කිරීමට ඉඩ තිබෙන බවයි.

**තවත් පිරිසක් කියන්නේ;**
ඔහු සම්බන්ධව සිටි නීති විරෝධි ක්‍රියාවන් සම්බන්ධයෙන් තොරතුරු හෙළිදරව් කර ''පාවාදීම'' නිසා, එම කණ්ඩායම විසින් ඔහුගේ ජීවිතයට හානි කිරීමට ඉඩ තිබෙන බවයි.

මාධ්‍යයෙන් දැන ගන්නට තිබෙන අන්දමට, ප්‍රධාන පුද්ගලයින් මෙන් මාහට අධිකරණයකට ගොස් ''මුණුබුරාට'' රැකවරණය දෙන මෙන් ඉල්ලීමට තරම් වත්කමක් මට නැත.

ඒ සඳහ මුදල් දීම්ට කිසිවෙක් ඉදිරිපත් වන්නේද නැත.

මා, ඉල්ලා සිටින්නේ, ඉහත සඳහන් කරුණ කෙරෙහි අවධානය යොමු කර, හපුආරච්චිගේ දොන් පියුම් හස්තික (පියුමා)ට,  ආරක්ෂාව සලසා දෙන ලෙසටය.
මෙයට,

----------- (ආච්චි)